DPL 2025/26

NILIS

# මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in Public Librarianship (පාඨමාලා කේතය: DPL)

### 1) හැඳින්වීම

වර්තමානයේ මහජන පුස්තකාලය ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය වෙමින් තිබේ. විශේෂයෙන්ම මහජන පුස්තකාලයේ සමාජීය සහ සංස්කෘතික භූමිකාව පුළුල් වෙමින් පවතින අතර එය පොත් බැහැර දීම, විමර්ශනය, ව්‍යාපෘති සේවා යනාදී සාම්ප්‍රදායික සේවාවලින් ඔබ්බට ගමන් කරමින් තිබේ. එහෙයින් මහජන පුස්තකාලවල සේවය කරන මෙන්ම මහජන පුස්තකාලවල සේවයට සම්බන්ධ වීමට අපේක්ෂිත පුද්ගලයන් හට වඩාත් පුළුල් සමාජ හා සංස්කෘතික දැනුමක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයක් වී ඇත. මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාවෙන් අපේක්ෂා කරනුයේ මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ මෙකී නවමු පරිවර්තනයට උර දිය හැකි වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමයි.

### 2) ඉලක්ක කණ්ඩායම

මහජන පුස්තකාලවල සේවය කරන හෝ මහජන පුස්තකාල කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම අයකු සඳහා.

### 3) බඳවා ගැනීමේ සුදුසුකම්

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 04 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම**.)**

  **හෝ**
- අ.පො.ස (සා.පෙ.) සමත්වීම **සහ** ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන **මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL) / මහජන පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACPL) හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.


### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු

- මහජන පුස්තකාලයේ නවමු භූමිකාව අවබෝධ කර ගැනීමට,
- ප්‍රජා පාදක සංවර්ධනයේ දී මහජන පුස්තකාලයේ කාර්ය භාරය හඳුනා ගැනීමට,
- සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා මහජන පුස්තකාලයේ දායකත්වය වටහා ගැනීමට,
- නවීන තාක්ෂණය ප්‍රජා සංවර්ධනයේ දී යොදා ගත හැකි ආකාරය හඳුනා ගැනීමට හැකි වනු ඇත.

### 5) පාඨමාලාවට අන්තර්ගත විෂයයන්

1. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ හැඳින්වීම
2. එකතු සංවර්ධනය සහ කළමනාකරණය
3. පුස්තකාල සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය
4. තොරතුරු සම්පත් හා සේවා
5. ව්‍යාපෘති වාර්තා සම්පාදනය
6. මාධ්‍ය සහ සාංස්කෘතික සාක්ෂරතාව
7. දේශීය දැනුම
8. ප්‍රජාව සහ මහජන පුස්තකාලය




6) **වැඩසටහනේ** වැදගත්කම: DPL පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.

7) **පාඨමාලා කාලය :** මාස 12

8) **මාධ්‍ය:** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

9) **පන්ති පැවැත්වීම :** දේශන මාර්ගගතව හා නීලීස් ආයතනයේදී පැවැත්වේ.

**10) ඇගයීම් ක්‍රමවේදය**

- සෑම විෂයක් සඳහාම පැවරුම් ලබා දෙන අතර ලිඛිත විභාගයක් ද පැවැත්වේ.එක් එක් විෂය සඳහා 50% ක් පැවරුම් වලින්ද ඉතිරි 50% ලිඛිත විභාගයෙන් ද ලකුණු එකතු කරනු ඇත. මෙයට අදාළව ව්‍යාපෘතියද සම්පූර්ණ කළ යුතුය.

**11) මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා සහතිකපත්‍රය ලබා ගැනීමට නම්**

- සියලුම විෂයන්ට අවම වශයෙන් C සාමාර්ථයක් ලබා ගත යුතුය. එනම් සෑම විෂයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය. විෂයන් තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවකට D හෝ E සාමාර්ථ තිබුණහොත් එම විෂයන් සඳහා පමණක් පුනර් පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

**12) පාඨමාලා ගාස්තු : සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 29000/= කි.** (වාරික දෙකකින් ගෙවිය හැක)

**13) අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය : 2025 ජුලි 04**

**14) පාඨමාලා ආරම්භය : 2025 අගෝස්තු**

**15) අයදුම් කරන ආකාරය**

I. අපගේ වෙබ් අඩවියෙන් (nilis.cmb.ac.lk)අයදුම්පත බාගත කරන්න.
II. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න.
III. උප්පැන්න සහතිකයේ, උ.පෙළ සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් අමුණන්න
IV. මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් සැකසීමේ ගාස්තුව ලෙස රු.300.00 ගෙවා, රිසිට් පත අයදුම්පතෙහි අදාළ කොටුවේ අලවන්න.
V. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2025 ජුලි 04** දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට තැපැල් කරන්න.

"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03"

දුරකථන: 011 2507150 / 0701478619